# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## තෙවන වාර පරීක්ෂණය - 2018

**නාට්‍ය හා රංග කලාව - II** | **12 ශ්‍රේණිය** | කාලය පැය තුනයි

**ප්‍රශ්න සියල්ලටම පිළතුරු සපයන්න.**

☺ **පහත සඳහන් පද්‍ය ඇසුරින් අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A. රුඳුරු මරු යකා මුගුරක් ගෙන අතට
රුඳුරු තරු දෙකා මෙන් නෙත් රැවිය මට
අඳුරු මරු යකා නර බිල්ල ගන් නට
පැඳුරු පිට තැබුවා යකුට ගන් නට

B. අඳුන් ගාන්නී නෙත් දෙක ඔමරි කරන්නී
මල් ගවසන්නී කොණ්ඩය ගොතා හෙලන්නී
තෝඩු දමන්නී පවලම් මාල බඳින්නී
සේල අඳින්නී පටකින් ඔබරි කරන්නී

C. "සමාගම් කරලා මට වැඩේ වැරදිලයි තියෙන්නේ"
"මට ඒක කරන්න නම් බැහැ"
"හොඳයි දනෙට මොනවද දෙන්නේ"

D. "දැන් මේ නම් ඉතිං පර සක්වල ගහන තාලේ තමයි"
"එහෙම නෙමෙයි අණ බෙරේ ප්‍රසිද්ධ කරන්න ආවා තමයි"

E. මගෙ මන්ත්‍රි නම් බිසෝගේ
යාඥව බෝය වේගේ

1. උඩරට ප්‍රදේශයට ආවේණික ජන නාට්‍ය ද්විත්වයට අයත් වන්නේ
   i. AC ii. BD iii. BC iv. AE v. DE

2. ශාන්තිකර්ම වලට අයත් සංවාද කවි කාණ්ඩය වනුයේ
   i. DE ii. CE iii. AC iv. CF v. AD

3. නාට්‍ය ගීතයක් ඇතුළත් නොවන කාණ්ඩය වනුයේ
   i. AB හා E ii. AC හා D iii. CB හා E
   iv. CD හා E v. CD හා A

4. උඩරට ගැමි නාටකයට අයත් වන්නේ
   i. A ii. C iii. D iv. B v. E

5. නූර්ති නාට්‍යයට අයත් වන්නේ
   A B C D E

6. බෞද්ධ පූජා කර්ම පමණක් සහිත පිළිතුර වන්නේ
   i. යක්කම් පහ/ පහතරට ශාන්තිකර්ම/ ගී මඩු
   ii. ආලවක දමනය/ ආසන දෙනේ බණ/ දෙරකඩ අස්න
   iii. නයා යක්කම/ කොහොඹ කංකාරිය/ ගම්මඩු
   iv. දෙවොල් මඩු/ දෙරකඩ අස්න/ රිද්දි යාගය
   v. සූවිසි විවරණය/ පුනා මඩු/ කිරි මඩු

7. උඩරට ශාන්තිකර්ම වලට පොදු ලක්ෂණයකි
   i. නානුමුරය ii. කපු යක්කාරිය iii. යක්කම් පහ
   iv. වඩිග පටුන v. අඹ විදමන

☺ **පහත දැක්වෙන ප්‍රකාශ ආශ්‍රයෙන් අංක 8 සිට 9 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A. පත්තිනි සංකල්පය හා බැඳී ඇතැයි සැලකේ.
B. පූර්ව රංගය ආරම්භ වන්නේ සබේ විදානගේ පැමිණීමෙනි.
C. ගැමියා විසින් චරිත හරහා සමාජ විවරණයක් සිදුකරනු ලබයි.
D. පාත්‍රයින් දෙදෙනෙකු පමණක් වෙස් මුහුණු පළඳී.
E. උපත් කතාවම නාට්‍යානුසාරයෙන් නොදක්වයි.
F. හාරිස්පත්තුව, වන්නි ප්‍රදේශ, බදුල්ල, සතර කෝරළය වැනි ප්‍රදේශවල ප්‍රචලිතය.
G. නාරිලතා, ගරුඬ රාක්ෂ, ගුරුළු රාක්ෂ වැනි වෙස් මුහුණු පළඳී

8. උඩරට ප්‍රදේශයට ආවේණික ජන නාට්‍යයට අදාළ කරුණු ඇතුළත් නිවැරදි ප්‍රකාශ තෝරන්න.
   i. CBAD ii. ABDE iii. BCDG iv. ADEG v. DEFG

9. ලංකාවේ බටහිර හා දකුණු වෙරළබඩ ප්‍රදේශවල ජන නාට්‍යය ප්‍රභේදයට අයත් සත්‍ය ප්‍රකාශය වනුයේ
   i. ABDE ii. BCDE iii. BCFH iv. DEFG v. EGCH

10. උත්තර රාම චරිතය කාගේ නිර්මාණයක්ද?
   i. චාල්ස් ඩයස් ii. ජෝන් ද සිල්වා iii. පිලිප්පු සිංඤෝ
   iv. සීදෙන් බස්තියන් v. චාල්ස් ද ආබෘේව්

11. කිඩ්සන් ලාම්පු භාවිත වූයේ කවර නාට්‍ය සම්ප්‍රදයේද?
   i. නූර්ති ii. සොකරි iii. කෝළම්
   iv. කවි නාඩගම් v. නාඩගම්

☺ **පහත දැක්වෙන තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 12 සිට 16 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A. ඔකෙස්ට්‍රාව B. බැල සන්න
C. නාට්‍ය අධ්‍යක්ෂණ D. රොලීනා
E. වේෂ භූෂණය F. චාල්ස් ඩයස්
G. ස්කීණිය H. E.F.C. ලුඩෝවයික්
I. රංග භූමිය J. ද ඉමැන්ජනරි ඉන්මැලිඩ්
K. සෙල්ලම්

12. ග්‍රීක නාට්‍ය හා සම්බන්ධ අක්ෂර වනුයේ
   i. AD ii. DG iii. AI iv. AG v. GK

13. නාඩගම් කලාව හා සම්බන්ධ අක්ෂර වන්නේ
   i. BI ii. BK iii. FI iv. DK v. DI

14. පොදුවේ නාට්‍ය කලාව හා සම්බන්ධ අක්ෂර වනුයේ

i. BEH ii. CEI iii. EGI iv. EHC v. CEJ

15. ඉංග්‍රීසි නාට්‍ය කලාව හා සම්බන්ධ අක්ෂර වනුයේ

i. AJ ii. AH iii. CH iv. DJ v. HJ

16. නූර්ති නාට්‍ය කලාව හා සම්බන්ධ අක්ෂර වනුයේ

i. DK ii. FI iii. DF iv. BI v. BD

17. රූකඩ ගෙදර නාට්‍යයේ නුවුරාගේ චරිතයට සම්බන්ධ සංකේත වන්නේ

i. නළු කාඩ්පත්, තරන්තලා හා තැම්බුරිනිය
ii. මැකරුන්, තරන්තලා නැටුම හා නත්තල් ගස
iii. පියානෝව, නත්තල් ගස හා පැනය
iv. සෙල්ලම් අශ්වයා, මැකරුන්, තරන්තලා
v. නත්තල් ගස, පියානෝව, සීත කඹාය

18. ස්වභාවික නාට්‍ය රීතියේ පුරෝගාමියා වන්නේ

i. හෙන්රික් ඉබ්සන් ii. ස්ටැනිස් ලැවුස්කි iii. එමින් සෝලා
iv. ෂෝන් ෆෝල් ශාස්ත්‍රය v. ටෙනිසි විලියම්

19. සොකරි නාට්‍යය සඳහා භාවිත කරන රංග භාණ්ඩය වන්නේ

i. මද්දලය හා තාලම්පට ii. ගැට බෙරය හා හොරණෑව
iii. සර්පිනාව හා තබ්ලාව iv. දවුල හා හොරණෑව
v. යක්බෙරය හා හොරණෑව

20. නූර්ති නාට්‍ය හා සම්බන්ධ රංග භාණ්ඩ වන්නේ

ගැට බෙරය හා හොරණෑව
උඩැක්කිය හා හොරණෑව
තබ්ලාව හා සර්පිනාව
සෝෂක බෙරය හා මද්දලය
දවුල හා සර්පිනාව

☺ **පහත දැක්වෙන තොරතුරු ඇසුරින් අංක 21 සිට 27 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A. රටයකුම B. දෙවොල් මඩුව
C. දහඅට සන්නිය D. සූනියම් යාගය
E. කොහොඹ කංකාරිය F. කිරි මඩුව
G. මැණික්පාල ශාන්ති කර්මය

21. නාට්‍යමය ලක්ෂණ ඇතුළත් නානුමුරය නයා යක්කම දක්නට ලැබෙන ශාන්තිකර්ම පිළිවෙලින්

i. AE ii. EG iii. AD iv. BE v. DF

22. අඹ විදමන දරු නැළවිල්ල දක්නට ලැබෙන්නේ පිළිවෙලින්

i. AC ii. BE iii. BA iv. EG v. AD

23. ඇත් බන්ධන, මී බන්ධන හා මරුවාගේ පැමිණීම දක්නට ලැබෙන්නේ

i. FA ii. CE iii. EG iv. GD v. FC

24. පහතරට සම්ප්‍රදායේ සූනියම් යාගය හඳුන්වන පර්යාය නාමයකි

i. A ii. B iii. E iv. D v. G

25. සේරමන් රජුගේ කථා ප්‍රවෘත්තිය සම්බන්ධ ශාන්තිකර්මය වන්නේ

i. D ii. E iii. B iv. A v. G

26. කාන්තාවකගේ ජීවිතයේ සංදිස්ථාන 03 ක් පෙන්නුම් කරන ශාන්තිකර්මයක් වන්නේ

i. F ii. C iii. A iv. D v. G

27. බණ්ඩාර දෙවි හත් තට්ටුව හා මෙලෙයි යකුන් පුදන ශාන්තිකර්මය වන්නේ

i. F ii. G iii. C iv. A v. E

28. වීදි නාට්‍ය කලාවේ ප්‍රබලයන් දෙදෙනෙකු වන්නේ

i. චිත්‍රසේන මහතා හා සුගතපාල ද සිල්වා
ii. මහින්ද ඩයස් හා ලයනල් අල්ගම
iii. ප්‍රේම කුමාර එපිටවෙල හා හෙන්රි ජයසේන
iv. ගාමිණී හත්තෙට්ටුගම හා පරාක්‍රම නිරිඇල්ල
v. පරාක්‍රම නිරිඇල්ල හා සයිමන් නවගත්තේගම

29. ආදි විශ්ව විද්‍යාලීය ඉංග්‍රීසි නාට්‍යයක් නොවනුයේ

i. රයිවල්ස් ii. ඉමැංනරි ඉන්වැලීඩ් iii. ග්ලාස් මොනාජරී
iv. වෙයා විමන් රූල් v. රයිට් යු ආ

30. යථාර්ථවාදී රංග රීතියේ පුරෝගාමියා වනුයේ

i. හෙන්රික් ඉබ්සන් ii. බර්ටෝල් බ්‍රෙස්ට් iii. ගාරපියා ලෝර්කා
iv. ටෙනිසි විලියම් v. භරත මුනිවරයා

☺ **පහත දැක්වෙන ප්‍රකාශ ආශ්‍රයෙන් අංක 31 සිට 37දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A. සුබ සහ යස B. මදුර ජවනිකා C. පෙරලෙන ඉරණම
D. ලංකා යක්ෂණී E. මහාසාර F. කඩවුණු පොරොන්දුව
G. පිටිසර කෙල්ල H. ආනන්ද ජවනිකා I. දෙවනි මහින්ද
J. හිරු නැති ලොව K. මුදලාලිගේ පෙරලිය L. බවකඩතුරාව
M. වෙද හටන N. දෝන කතරිනා

31. ඓතිහාසික මූලාශ්‍ර පදනම් කරගත් නාට්‍ය කෘති 3 ක් වන්නේ

i. ABD ii. NLK iii. BCD iv. AIN v. KMJ

32. මිනර්වා නාට්‍යය සම්ප්‍රදයට අයත් නාට්‍ය දෙක වන්නේ

i. CF ii. DE iii. CK iv. JN v. FG

33. ටීටර් සම්ප්‍රදයට අයත් නාට්‍ය දෙක වන්නේ

i. BE ii. FA iii. DG iv. KH v. MN

34. දයානන්ද ගුණවර්ධන ශූරීන්ගේ නාට්‍යය ද්වන්ධය වන්නේ

i. DE ii. BH iii. MJ iv. FH v. AE

35. ආදි විශ්ව විද්‍යාලයීය සිංහල නාට්‍ය සම්ප්‍රදයට අයත් නාට්‍යය 2ක් වන්නේ

i. BC ii. AE iii. DB iv. JK v. KM

36. සරච්චන්ද්‍ර ශූරීන්ගේ නාට්‍යය දෙකක් වන්නේ

i. GH ii. EL iii. FI iv. KM v. CD

37. රංජිත් ධර්මකීර්තිගේ නාට්‍යයක් වන්නේ

i. J ii. D iii. K iv. L v. H

38. Run for your wife අනුවර්තනය කරනු ලැබුවේ

i. සයුරෙන් ආ ළඳ ii. රෝමය ගිනිගනී iii. ජන හතුරා
iv. පුත්‍ර සමාගම v. පැන්ස තුනේ කථාව

39. සොෆොක්ලිස්ගේ ඊඩිපස් රෙක්ස් නමැති නාට්‍යය ඊඩිපස් රජ නමින් පරිවර්තනය කළ පරිවර්තකයා කවුද?

i. පියදස නිශ්ශංක ii. ආරියවංශ රණවීර iii. සුනිල් විජේසිරිවර්ධන
iv. මැන්ඩියස් රෝහණදීර v. බන්දුල ජයවර්ධන

40. ඩෝල් හවුස් නාට්‍ය බෝනික්කි ගෙදර නමින් පරිවර්තනය කළ පරිවර්තකයා කවුද?

i. පියදස නිශ්ශංක ii. සුනිල් විජේසිරිවර්ධන iii. ආරියවංශ රණවීර
iv. ප්‍රසන්න විතානගේ v. විජිත ගුණරත්න

## II කොටස

☺ **A හා B වලින් ප්‍රශ්න 02 බැගින් තෝරා ගෙන ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.**

### A කොටස - දේශිය නාට්‍ය කලාව

**01.**

i. උඩරට, පහතරට, සබරගමු යන සම්ප්‍රදයට අයත් ශාන්තිකර්ම දෙක බැගින් නම් කරන්න.

ii. ඉහත සම්ප්‍රදයන් තුනේම ශාන්තිකර්මවල දක්නට ලැබෙන නාට්‍යමය අන්තර් රංග අවස්ථා වෙන වෙනම පෙන්වා දෙන්න.

iii. උඩරට හෝ පහතරට නර්තන සම්ප්‍රදයට අයත් ශාන්තිකර්මයන්හි එන නාට්‍යමය අවස්ථා 02ක් සංවාද භාවිතය, රංගනය, අවස්ථා නිරූපණය ආදිය සැලකිල්ලට ගනිමින් විස්තර කරන්න.

**02.**

i. බොහෝ කලක් ජනප්‍රියව පැවති නාඩගම් කලාව පිරිහීමට හේතු 4 ක් කෙටියෙන් පෙන්වා දෙන්න.

ii. නාඩගම් රංග ශෛලිය පිළිබඳ විමසන්න.

iii. නූර්ති වලින් අනතුරුව සිංහල නාට්‍ය කලාව තුළ ඇතිවූ වෙනස්කම් විමර්ශනය කරන්න.

**03.**

i. කුවේණි නාට්‍යයේ දෘෂ්ටිය කුමක්ද?

ii. කුවේණි නාට්‍යය සාර්ථක කර ගැනීම වස් නිර්මාණකරු යොදගෙන ඇති උපක්‍රම කෙටියෙන් පෙන්වා දෙන්න.

iii. කුවේණි සදකාලික ගැහැණියයි. ඔබ මේ කියමනට කොතෙක් දුරට එකඟ වන්නේ ද නිදර්ශක සහිතව හේතු දක්වන්න.

### B කොටස - විදේශිය නාට්‍ය කලාව

**04.**

i. ග්‍රීක නාට්‍ය කලාවේ ප්‍රභවය සිදුවී ඇති ආකාරය සැකවින් පෙන්වා දෙන්න.

ii. ග්‍රීක ට්‍රැජඩි නාට්‍යකරුවන් තිදෙනෙක් නම් කර ට්‍රැජඩි පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

iii. ග්‍රීක කොමඩි නාට්‍යයේ වර්ධනයට ඇරිස්ටොෆානිස්ගෙන් සිදුවූ දයකත්වය නිදර්ශක සහිතව පෙන්වා දෙන්න.

**05.**

i. යථාර්ථවාදී රංග රීතියේ ලක්ෂණ 04 ක් නම් කරන්න.

ii. "ඩෝල් හවුස්හි" සංකේත භාවිතය පිළිබඳ විමසීමක් කරන්න.

iii. රූකඩ ගෙදර නාට්‍ය නිදසුන් වශයෙන් ගෙන හෙන්රික් ඉබ්සන්ගේ රංග රීතියට උදහරණ දෙමින් පැහැදිලි කරන්න.

**06.**

i. ඉංග්‍රීසි නාට්‍ය කලාවට පුරෝගාමී වූ පුද්ගලයා කවුද? ඔහුගේ දයකත්වය සැකවින් පෙන්වා දෙන්න.

ii. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ පර්යේෂණාත්මක නාට්‍ය සිංහල නාට්‍යය කලාවේ පෝෂණයට බලපෑ ආකාරය සැකවින් දෙන්න.

iii. ජනතා සිතුම් පැතුම් හා අපේක්ෂාවන් නූතන සිංහල නාට්‍යයෙන් කොතෙක් දුරට නිරූපණය වේදැයි නිදසුන් සහිතව පෙන්වා දෙන්න.